# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

2020.06. 17

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date ……………………


චක්‍රලේඛ අංකය 07/2020

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම හා අලුතින් නම් ඇතුලත් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධ අංක 03/2014 හා 2014.02.18 දිනැති චක්‍රලේඛයෙහි ඇතුලත් කරුණු වර්ගීකරණය කරමින් වඩාත් විස්තරාත්මකව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. නම් සංශෝධනය මගින් ජාතික ආරක්ෂාවට මතුවිය හැකි ගැටළුද සලකා බලමින් ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස්ද ලබා ගනිමින් සකස් කළ මෙම චක්‍රලේඛය අනුව උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම හා අළුතින් නමක් ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

02.) 2014.02.18 දිනැති 03/2014 චක්‍රලේඛයේ එක සිට හතරවන කරුණු දක්වා ඇති උපදෙස් ඒ අයුරින්ම වලංගු වේ. (චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත)

1. උප්පැන්න සහතිකයක තුන්වන පිටපතෙහි නිවැරදිව නම සඳහන් වන නමුත් මුල් හා දෙවන පිටපත්වල නම වෙනස් වූ අවස්ථාවකදී, එනම්
   - 1.1. නමෙහි ඉස්පිලි පාපිලි ආදියෙහි වෙනස්කම් ඇති විට
   - 1.2. අක්ෂර වින්‍යාස දෝෂ ඇති විට
   - 1.3. ස්ත්‍රී, පුරුෂ භාවය වෙනස්වන ආකාරයෙන් නම ලියා ඇති විට
   - 1.4. වචන අතර පරතරය / අකුරු අතර පරතරය වෙනස් වන විට
   - 1.5. නමෙහි කොටස් අත් හැරීම හෝ වැඩිපුර කොටස් සටහන් වී තිබෙන විට

   ඉහත ආකාරයේ වෙනස්කම් පවතින අවස්ථාවකදී තුන්වන පිටපත නිවැරදි වීම මත නම භාවිතා කළ බවට සෙසු ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවකදී ලේඛනවල නිරවද්‍යතාවය සනාථ කර ගැනීමෙන් පසු මුල් පිටපතේ දෙවන තීරයේ අවශ්‍ය සංශෝධනය සිදුකර, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ අත්සන සමඟ සංශෝධනය සිදු කළ දිනය සටහන් කරන්න. ඊට පසු දෙවන පිටපත සංශෝධනය සඳහා උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 12(2) වගන්තිය යටතේ මධ්‍යම ලේඛනාගාරය වෙත උධෘතයක් යොමු කිරීමද කළ යුතුය.

   <u>අවශ්‍ය ලියවිලි</u>

   - i. ඉල්ලීම් ලිපිය
   - ii. දිවුරුම් ප්‍රකාශය
   - iii. ඉල්ලුම් කරන නම භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන තුනක් ප්‍රමාණවත්) (නොමිලයේ ලබා දුන් පිටපත තිබේනම් ඉදිරිපත් කරන්න. 1.5 කරුණ සඳහා නොමිලයේ ලබාදුන් පිටපත අනිවාර්ය බව සලකන්න)


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk

2. දෙවන තීරයේ ඇති නමට පියාගේ නම තීරයේ ඇති වාසගම ඇතුලත් කිරීම, දෙවන තීරයේ ඇති වාසගම අත්හැරීම හෝ නම කෙටි කොට භාවිතා කිරීම. (උදා:- විලියම් යන්න විලී ලෙස)

<u>අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රය
ii. පුවත්පත් දැන්වීම
iii. දිවුරුම් ප්‍රකාශය
iv. ග්‍රාම නිලධාරි වාර්තාව
v. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන තුනක් ප්‍රමාණවත්)

3. දෙමාපියන් ජාතීන් දෙකකට අයත් වන විට මවගේ හෝ පියාගේ ජාතිය නිරූපණය වන අයුරින් නම සංශෝධනය කිරීම / ඇතුලත් කිරීම.

<u>අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය (ඇමුණුම 1 හෝ ඇමුණුම 2)
iii. පුවත්පත් දැන්වීම
iv. දිවුරුම් ප්‍රකාශය (ජාතිය වසන් කිරීමේ අරමුණක් නොමැති බව සඳහන් විය යුතුය)
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. දෙමාපියන්ගේ විවාහ සහතිකය (තිබේනම්)
vii. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන තුනක් ප්‍රමාණවත්)

4. මෙතෙක් භාවිතා කළ නම වෙනුවට සම්පූර්ණයෙන් නම වෙනස් වන ආකාරයෙන් නම් ඇතුලත් කිරීම (ජාතිය වෙනසකට ලක් නොවන ආකාරයේ)

<u>අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය (ඇමුණුම 1 හෝ ඇමුණුම 2)
iii. පුවත්පත් දැන්වීම
iv. දිවුරුම් ප්‍රකාශය
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන තුනක් ප්‍රමාණවත්)

5. තමන්ගේ ජාතිය නිරූපණය නොවන ආකාරයේ සම්පූර්ණයෙන් වෙනස් නමක් ඇතුලත් කිරීම

<u>අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය (ඇමුණුම 1 හෝ ඇමුණුම 2)
iii. පුවත්පත් දැන්වීම
iv. දිවුරුම් ප්‍රකාශය (ජාතිය වසන් කිරීමේ අරමුණක් නොමැති බව සඳහන් විය යුතුය)
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. ආගම වෙනස් කොට ඇති අවස්ථාවකදී අදාල ආගමික සිද්ධස්ථානයකින් ලබාගත් ලිපියක්
vii. විවාහක තත්ත්වය මත ආගම වෙනස් කොට ඇති අවස්ථාවකදී විවාහ සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ
viii. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන තුනක් ප්‍රමාණවත්)

03) නමක් වෙනස්කර ගැනීමට ඉල්ලීමක් ලැබෙන විට, එම ඉල්ලීමට හේතුව හා ඉල්ලුම්කරුගේ අනන්‍යතාවයද තහවුරු කර ගැනීම අනිවාර්යය වේ. යෝජිත නම භාවිතා කර ඇති බවට ඉදිරිපත් කරන ලිඛිත සාක්ෂි ලේඛනවල නිර්ව්‍යාජ භාවය පිළිබඳවද සොයා බැලිය යුතුය. එසේම ඉල්ලුම්කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කළ බව සඳහන් කරන ලියවිලි ඉල්ලීමෙන් අපේක්ෂා කරනුයේ නම සංශෝධනය කිරීමට අදහස් කරන අය, සංශෝධනය කිරීමට බලාපොරොත්තුවන නමින් මෙතෙක් කල් සමාජයේ කටයුතු කර තිබෙන බව තහවුරු කර ගැනීම වේ. එමගින්, වංචනික අරමුණකින් තොරව ඉල්ලුම්කරුට තමාගේ නම සංශෝධනය කර ගැනීමේ සැබෑ අරමුණක් තිබේද යන්න සනාථ කර ගැනීමට හැකියාව ලැබේ.

04) 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වන වගන්තිය යටතේ නම් සංශෝධනය සඳහා පුද්ගලයන්ට අයිතියක් ඇත. නමුත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තහවුරු කිරීමද වැදගත් වන බැවින් ආරක්ෂක අමාත්‍යාංශය සමග සාකච්ඡා කොට සකස් කරන ලද තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත ( ඇමුණුම 1 හා 2) නිවැරදිව සම්පූර්ණ කර ගැනීම අනිවාර්යය වේ. විශේෂයෙන් 3, 4, 5 අවස්ථාවන් යටතේ ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් වන අවස්ථාවකදී ඉදිරිපත් කරනු ලබන ලේඛන වලට අමතරව වාචික සාක්ෂි හා ප්‍රකාශ මගින් කරුණු සනාථ කර ගැනීමෙන් පසු අදාල සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම වඩාත් සුදුසුය. ඉදිරිපත් කර තිබෙන කරුණු ගැන යම් සැකයක් තිබේනම්, ප්‍රකාශ පත්‍රය අනුමත කිරීම ප්‍රතික්ෂේප කර ඒ බව අයදුම්කරු වෙත ලිඛිතව දන්වා අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වන ලෙස උපදෙස් ලබා දීම උචිතය.

05) එසේම සෑම මසකම ඉහත 3, 4, 5 අවස්ථාවන් යටතේ සිදුකරන ලද නම් සංශෝධන වලට අදාල ඇමුණුම 1 හා ඇමුණුම 2 තොරතුරු පත්‍රිකාවල සහතික කරන ලද පිටපත් සහ නම් සංශෝධනය කරන ලද සියළුම පුද්ගලයන්ගේ තොරතුරු සම්බන්ධයෙන් වාර්තාවක් පහත පරිදි සකස් කරන ලද ආකෘතියක් අනුව ඊළඟ මස 10 වන දිනට පෙර සිවිල් ලියාපදිංචි කිරීමේ අංශයට ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුය.

| ප්‍රකාශ පත්‍ර අංකය හා දිනය | උප්පැන්න සහතිකයේ අංකය දිනය හා කොට්ඨාසය | උප්පැන්න සහතිකයේ සඳහන් නම | අළුතින් ඇතුලත් කරන ලද / වෙනස් කරන ලද නම | ප්‍රකාශකරුගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|
| | | | | |

06) ඉහත උපදෙස් තරයේ අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වන අතර මෙම උපදෙස් උල්ලංඝනය වන පරිදි කූඨ ලේඛන සකස් කිරීමක් අනාවරණය වුවහොත් දැඩි විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පිටපත්:-

| | |
|---|---|
| 1.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - දැන ගැනීම සඳහා |
| 2.ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - දැ. ගැ.ස හා ඇමුණුම් 1 හා 2 සම්පූර්ණ කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුවේ සහය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දීම සඳහා |
| 3.ජාතික බුද්ධි ප්‍රධානී,ආරක්ෂක අමාත්‍යාංශය | -අ.ක.ස. හා දැ.ගැස. |
| 4.සියළුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් | - දැන ගැනීම සඳහා |
| 5.සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් | - දැන ගැනීම සඳහා |
| 6.මධ්‍යම ලේඛනාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් | - දැන ගැනීම සඳහා |
| 7.ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් | - දැන ගැනීම සඳහා |
| 8.සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් | - දැන ගැනීම සඳහා |

ඇමුණුම 1

## උප්පැන්න සහතිකයේ දෙවන තීරයේ සඳහන් නම සංශෝධනය කිරීම.

වයස අවුරුදු 07 සිට21 තෙක්

| |
|---|
| උප්පැන්නයට අදාලව<br>දිස්ත්‍රික්කය: .............................................<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ...........................................................................................<br>උප්පැන්න සහතිකයේ අංකය : .............................. උපන් දිනය: .................................................<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සම්පූර්ණ කළ යුතුය |

1.උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි :

අ. නම: .......................................................................................................................

ආ. සම්පූර්ණ නම : ........................................................................................................

.........................................................................................................................................

2. සංශෝධනයෙන් පසු භාවිත කිරීමට බලාපොරොත්තු වන නම : ..........................................

.......................................................................................................................................

3. ජාතික හැදුනුම්පත් අංකය: ......................................................................

4. ගුවන් ගමන් බලපත්‍ර අංකය: ...................................................................

5. රියදුරු බලපත්‍ර අංකය : .........................................................................

(3, 4, 5 අනන්‍යතා අංක අතරින් එක් අංකයක් හෝ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. එසේ නොමැති නම් ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය)

6. ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර:

අ. පදිංචි ලිපිනය: .........................................................................................................

.........................................................................................................................................

ආ. ග්‍රාම නිලධාරී වසම : ...............................................................................................

ඇ. ආසන්න නගරය : .....................................................................................................

ඇ. දිස්ත්‍රික්කය : .............................................................................................................

(අයදුම්කරුගේ පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය (ඩී.එස් 4) ඉදිරිපත් කල යුතුයි)

7.තාවකාලික ලිපිනය : ........................................................................................................

........................................................................................................................

8. තාවකාලික ලිපිනයෙහි පදිංචි වීමට හේතුව :.......................................................................

........................................................................................................................

9. පෙර පදිංචි ලිපිනයන්

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

10. දුරකථන අංකය: ස්ථාවර...................................... ජංගම ........................................

11. ඊ-මේල් ලිපිනය: ( තිබේ නම්) ..............................................................................................

12. අ.) රැකියාව/වෘත්තිය : ...............................................................................................

ආ.) රැකියා/ වෘත්තිය ස්ථානයේ ලිපිනය.........................................................................

........................................................................................................................

13.මවගේ විස්තර :

අ. සම්පූර්ණ නම : .......................................................................................

.......................................................................................................

ආ. ජාතිය : ..............................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

14. පියාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : .......................................................................................

.......................................................................................................

ආ. ජාතිය : ..............................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

15.උප්පැන්න සහතිකය හිමි අයගේ විවාහක/අවිවාහක බව: ............................................................

16. කලත්‍රයාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : ...................................................................................

ආ. ලිපිනය : ............................................................................................

ඇ. ජාතිය : ...........................................................................

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

ඉ. රැකියාව :..........................................................................

ඊ. රැකියා ස්ථානයේ ලිපිනය:.......................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | වයස |
|---|---|
| ............................................................................................ | .................. |
| ............................................................................................ | .................. |
| ............................................................................................ | .................. |
| ............................................................................................ | .................. |

18.සහෝදර / සහෝදරියන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක හා දැනට පදිංචි ලිපිනයන් පිළිබඳ විස්තර :

| නම | ජා.හැ .අංකය | ලිපිනය |
|---|---|---|
| ................................................ | ................................ | ......................................... |
| ................................................ | ................................ | ......................................... |
| ................................................ | ................................ | ......................................... |
| ................................................ | ................................ | ......................................... |

(හැකි සෑම තොරතුරක්ම ලබා දිය යුතුය)

19. මීට පෙර නම සංශෝධනය කර තිබේනම් කලින් භාවිත කළ නම් සඳහන් කරන්න.

1.............................................................................................................................................

2.............................................................................................................................................

3.............................................................................................................................................

20. නම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන හේතුව පැහැදිලිව සඳහන් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

21. ප්‍රකාශකගේ :

අ. සම්පූර්ණ නම : ...........................................................................

ආ. ජාතිය : ........................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

ඈ. ලිපිනය : ........................................................................

22.ප්‍රකාශ කරන්නේ කවරකු වශයෙන් ද යන්න: ( මව / පියා/ භාරකරු)
(අනවශ්‍ය වචනය කපා හරින්න)

ඉහත සඳහන් තොරතුරු මා සතුව පවතින ලිඛිත සාක්ෂි අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

වැරදි හෝ අසත්‍ය තොරතුරු ලබා දීමෙන් සිදුවන සියලුම ආකාරයේ නීතිමය හෝ නීතිමය නොවන

වගකීමකට මා යටත් වන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

................................................ ................................................

ප්‍රකාශකයාගේ අත්සන දිනය

.............................................................................................................................................. වන

ජාතික හැඳුනුම්පත් අංක ......................................... දරන අය මෙම පොලිස් වසමට අයත් ............

..............................................................................................................................................

ලිපිනයේ ස්ථිර/තාවකාලික පදිංචිකරුවකු බව සහතික කරමි.

................................................... ................................................

පොලිස් ස්ථානාධිපති ( අත්සන හා නිල මුද්‍රාව) දිනය

ඇමුණුම 2

**උප්පැන්න සහතිකයේ දෙවන තීරයේ සඳහන් නම සංශෝධනය කිරීම.**

**වයස අවුරුදු 21 ට වැඩි**

<table><tr><td>උප්පැන්නයට අදාලව<br>දිස්ත්‍රික්කය: ............................................<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ...................................................................................<br>උප්පැන්න සහතිකයේ අංකය : ............................ උපන් දිනය: ...............................................<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සම්පූර්ණ කළ යුතුය</td></tr></table>

1.උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි :

අ. නම: ..........................................................................................................

ආ. සම්පූර්ණ නම : ...........................................................................................

2. සංශෝධනයෙන් පසු භාවිත කිරීමට බලාපොරොත්තු වන නම :

...................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය: .................................................................

4. ගුවන් ගමන් බලපත්‍ර අංකය: ...............................................................

5. රියදුරු බලපත්‍ර අංකය : ......................................................................

(3, 4, 5 අනන්‍යතා අංක අතරින් එක් අංකයක් හෝ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. එසේ

නොමැති නම් ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය)

6. ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර:

අ. පදිංචි ලිපිනය: ...........................................................................................

...................................................................................................................................

ආ. ග්‍රාම නිලධාරී වසම : ...........................................................................

ඇ. ආසන්න නගරය : ...............................................................................

ඇ. දිස්ත්‍රික්කය : ......................................................................................

(අයදුම්කරුගේ පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය (ඩී.එස් 4) ඉදිරිපත් කල යුතුයි)

7.තාවකාලික ලිපිනය : .......................................................................................................

.......................................................................................................

8. තාවකාලික ලිපිනයෙහි පදිංචි වීමට හේතුව :.......................................................................

.......................................................................................................

9. පෙර පදිංචි ලිපිනයන්

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

10. දුරකථන අංකය: ස්ථාවර.................................. ජංගම ..................................

11. ඊ-මේල් ලිපිනය: (තිබේ නම්)..........................................................................

12. අ.) රැකියාව/වෘත්තිය : ..........................................................................

ආ.) රැකියා/ වෘත්තිය ස්ථානයේ ලිපිනය

.......................................................................................................

.......................................................................................................

13.මවගේ විස්තර :

අ. සම්පූර්ණ නම : ..........................................................................

..........................................................................

ආ. ජාතිය : ..........................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

14. පියාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : ..........................................................................

..........................................................................

ආ. ජාතිය : ..........................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

15.උප්පැන්න සහතිකය හිමි අයගේ විවාහක/අවිවාහක බව: ...................................

16. කලත්‍රයාගේ විස්තර:

අ. නම : ..........................................................................

ආ. ලිපිනය : ....................................................................

ඇ. ජාතිය : .........................................................................

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................

ඉ. රැකියාව :........................................................................

ඊ. රැකියා ස්ථානයේ ලිපිනය:.....................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | වයස |
| --- | --- |
| ...................................................................................... | .................. |
| ...................................................................................... | .................. |
| ...................................................................................... | .................. |
| ...................................................................................... | .................. |

18.සහෝදර / සහෝදරියන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක හා දැනට පදිංචි ලිපිනයන් පිළිබඳ

විස්තර :

| නම | ජා.හැ .අංක | ලිපිනය |
| --- | --- | --- |
| ................................................ | ................................ | ........................................ |
| ................................................ | ................................ | ........................................ |
| ................................................ | ................................ | ........................................ |
| ................................................ | ................................ | ........................................ |

(හැකි සෑම තොරතුරක්ම ලබා දිය යුතුය)

19. මීට පෙර නම සංශෝධනය කර තිබේනම් කලින් භාවිත කළ නම් සඳහන් කරන්න.

1.............................................................................................................................................

2............................................................................................................................................

3.............................................................................................................................................

20. නම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන හේතුව පැහැදිලිව සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

21. අයදුම්කරු සම්බන්ධයෙන් සිවිල් උසාවි නඩු තිබේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

(කාරණය, උසාවිය හා නඩු අංකය ඇතුලත්ව)

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.........................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු මා සතුව පවතින ලිඛිත සාක්ෂි අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

වැරදි හෝ අසත්‍ය තොරතුරු ලබා දීමෙන් සිදුවන සියලුම ආකාරයේ නීතිමය හෝ නීතිමය නොවන

වගකීමකට මා යටත් වන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

............................................... ...............................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

.................................................................................... නම දරන හා ජාතික හැඳුනුම්පත් අංක

.................................. දරන අය ............................................................................................

ලිපිනයේ ස්ථිර/තාවකාලික පදිංචිකරුවකු බව හා ඉහත නම සඳහන් පුද්ගලයා මෙම පොලිස් වසමේ

පදිංචි අයෙකු බවත් සහතික කරමි.

.................................................. ...............................................

පොලිස් ස්ථානාධිපති ( අත්සන හා නිල මුද්‍රාව) දිනය